කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** LRA/26/09/15/01

වර්ණය : ඇම්බර්


තද වැසි පිලිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2026 සැප්තැම්බර් මස 16 වන දින පෙ. ව 08.30 දක්වා වලංගු වන පරිදි
2026 සැප්තැම්බර් මස 15 වන දින පෙ. ව 03.00 නිකුත් කරන ලදී.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණ සහ ඌව පලාත්, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා

සූදානම් වන්න!

ශ්‍රී ලංකාව ආසන්න පහල වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන්, බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණ සහ ඌව පලාත්වලත් අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වලත් අහස වලාකුළින් බරව පවතින අතර විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. මෙම ප්‍රදේශ වල ඇතැම් ස්ථාන වලට මි. මී 100 ට වැඩි තද වැසි ඇති විය හැක.



2026.09.14 පෙ.ව 8.30 සිට 2026.09.15 දින පෙ.ව 3.00 දක්වා කාලය තුල වාර්තාවූ (දැනට ලැබී ඇති) වර්ෂාපතන අගයන් පහත දක්වා ඇත.

ස්වයංක්‍රිය වර්ෂාමාන මධ්‍යස්ථානය	දිස්ත්‍රික්කය	වර්ෂාපතනය (මි.මී)
සේලතාලාරාමය, කිරිදිවැල	ගම්පහ	146.5
හල්වතුර වත්ත	කළුතර	123.5
ගුරුදියපොත කර්මාන්ත ශාලාව	ගාල්ල	117.0
කරඳන තේ කර්මාන්ත ශාලාව	රත්නපුර	114.5
මඩොල්තැන්න වත්ත	කෑගල්ල	109.0
තල්දූව වත්ත	කෑගල්ල	108.0
එලදූව වත්ත, එලදූව.	කළුතර	105.0

වර්ණය: -රතු
අනතුරු ඇඟවීම (පියවර ගන්න)

වර්ණය: -ඇම්බර්
අවවාදාත්මක (සූදානම් වන්න)

වර්ණය: -කොළ
(බලපෑමක් නැත)